## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බදුල්ල

## ඌව පළාත් සමාජ විද්‍යා තරගාවලිය - 2022

**12/13 ශ්‍රේණිය** | කාලය : පැය 02.30 යි.

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම : ..................................................................................................

පාසලේ නම : ..................................................................................................

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

01. 2019 වර්ෂයේ ලෝකය කැළඹූ කොවිඩ් 19 වෛරසය උපන් නගරය වන්නේ,
1.චීනය 2. බීජිං 3. වූහාන් 4. ටෝකියෝ 5. ජපානය (........)

02. රාජ්‍යයක උත්තරීතර නීතිය ලෙස සැලකෙන්නේ,
1.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. 2. ආගම. 3. විශාරද මත
4. අධිකරණ තීන්දුව. 5. සිරිත් විරිත්. (........)

03. 2017 වර්ෂයේ න්‍යෂ්ඨික අවි අත්හදා බැලීම් මාලාවක් සිදු කර ලෝක සාමය අභියෝගයට ලක් කළ රට වන්නේ,
1.දකුණු කොරියාව 2. උතුරු කොරියාව 3. ජපානය
4. ඇමෙරිකා එක්සත් ජනපදය 5. චීනය (........)

04. ලොව උසම ස්ථානයක පිහිටි විල වන්නේ,
1. අයර් විල 2. බයිකල් විල 3. බොල්කෑෂ් විල
4. ටිටිකාකා විල 5. මිචිගන් විල (........)

05. උඩරට රජවරු පෘතුගීසීන් හා සිදු කළ සටන් වලින් II රාජසිංහ රජතුමා නායකත්වය දුන් සටන වන්නේ,
1.මුල්ලේරියා සටන
2. දන්තුරේ සටන
3. බලන සටන
4.ගන්නෝරුව සටන
5. රන්දෙණිවල සටන (.......)

(ලකුණු 2 x 5 =10)

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

06. පංච මහා වාද වලට අයත් වාද පමණක් දැක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,
A. වරාගොඩ වාදය B. පානදුරා වාදය C. උඳුපිටිගොඩ වාදය
D. ගම්පොළ වාදය E. බද්දේගම වාදය

1.A B D හා E ය. 2. A B C හා D ය. 3. A E C හා D ය.
4.A D E හා C ය. 5. B C E හා D ය.

07. ලෝකයේ භූමිකම්පා ඇතිවන ප්‍රධාන කලාප පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,
A. පැසිපික් සාගරය වටා විහිදී ඇති පැසිපික් කලාපය.
B. මධ්‍යධරණී හිමාලයා කඳු කලාපය.
C. මධ්‍ය අත්ලාන්තික් සාගරික වැටි කලාපය.
D. අප්‍රිකානු සාගරික වැටි කලාපය.
E. නැගෙනහිර පැසිපික් සාගරික වැටි කලාපය.

1.A B C හා D ය. 2. A B C හා E ය. 3. A B D හා E ය.
4.B E D හා A ය 5. E D C හා B ය.

08. සාර්ක් සංවිධානයට අයත් රටවල් පමණක් අයත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
A. නේපාලය B. බුරුමය C. බංග්ලාදේශය D. ඉන්දියාව E. භූතානය

1. A C D හා E ය. 2. A C D හා B ය. 3. A B C හා D ය.
4. A B D හා C ය. 5. A B D හා E ය.

09. ෆැසිස්ට්වාදී චින්තනයේ සහ දේශපාලනයේ ප්‍රධාන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
A. දේශපාලන ඒකබලවාදය B. රණකාමිත්වය C. රාජ්‍ය වන්දනය
D. අත්‍යයන්ත වර්ගවාදය හා උග්‍ර ජාතිවාදය E. පෞද්ගලික නිදහස

1. A B C හා E ය. 2. A C D හා E ය. 3. B C D හා E ය.
4. A B D හා E ය. 5. A B C හා D ය.

10. පළමුවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව වර්සෙල්ස් සාම ගිවිසුම ඇති කර ගැනීම සඳහා ප්‍රංශයේ පැරිස් නුවර දී පවත්වන ලද සාකච්ඡා වලට සම්බන්ධ රටවල් හා අදාළ නියෝජිතයින් අඩංගු පිළිතුරු කාණ්ඩය වන්නේ,
A. ඇමෙරිකා එක්සත් ජනපදය - වුඩ්රෝ විල්සන්
B. බ්‍රිතාන්‍ය - ලොයිඩ් ජෝර්ජ්
C. ප්‍රංශය - ක්ලෙමෙන්සෝ
D. ඉතාලිය - ඕලැන්ඩෝ
E. රුසියාව - ස්ටාලින්

1. A B C හා D ය. 2. A B D හා E ය. 3. A B C හා E ය.
4. A C D හා E ය. 5. B C D හා E ය.

(ලකුණු 2 x 5 =10)

ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා හිස්තැන්වලට පිළිතුර යොදා වාක්‍යයන් සම්පූර්ණ කරන්න.

11. ලෝකයේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශය ______________________ ය.

12. පරිගණකයේ දත්ත ගබඩා කිරීමට භාවිතා කෙරෙන කුඩාම ඒකකය
______________________ ලෙස හැඳින්වේ.

13. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අධිකරණය වන ජාත්‍යන්තර අධිකරණය නෙදර්ලන්තයේ
______________________ නුවර පිහිටා ඇත.

14. අමාවතුර කෘතිය ______________________ විසින් රචනා කර ඇත.

15. ඇමෙරිකාවේ ජාතික ක්‍රීඩාව ______________________ වේ.

(ලකුණු 2 x 5=10)

- **ප්‍රශ්න අංක 16 සිට 25 දක්වා වූ ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

16. "විරාගය" නවකතාවේ කතුවරයා ______________________ ය.

17. මධ්‍යම පළාතට අයත් විශිෂ්ට කැටයම් කලාවක් පෙන්නුම් කරන ආගමික සිද්ධස්ථානය
______________________ යි.

18. ලොව පැරණිතම මෙන්ම දිගම දුම්රිය මාර්ගය ______________________ වේ.

19. බාලදක්ෂ ව්‍යාපාරය ලෝකයට හඳුන්වා දුන්නේ ______________________ ය.

20. ශ්‍රී ලංකාවේ වෙරළ ආරක්ෂාව සඳහා ස්වභාවිකව වැඩුණු ගහ විශේෂය
______________________ නමින් හැඳින්වේ.

21. ජාත්‍යන්තර කීර්තියට පත් පානදුරාවාදය ගැන අසා මෙරටට පැමිණියේ
______________________ තුමාය.

22. "කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" යන ගෞරව නාමයෙන් පිදුම් ලැබුවේ
______________________ රජු ය.

23. විදුලි පණිවිඩ ක්‍රමය ලොවට හඳුන්වා දුන්නේ ______________________ ය.

24. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති පැරණිතම වංස කතාව වන්නේ
______________________ යි.

25. ලෝකයේ පියස්ස යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන ලොව උසම සානුව
______________________ ය.

(ලකුණු 2 x 5 = 10)

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා A B C D හා E යන පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



A



B



C



D



E

26. i. A රූපයෙන් දැක්වෙන රාජ්‍ය නායකයා නම් කරන්න.

______________________________

ii. ඔහුගේ දේශපාලන පක්ෂයේ නම සඳහන් කරන්න.

______________________________

27. i. B රූපයෙන් දැක්වෙන රාජ්‍ය නායකයා නම් කරන්න.

______________________________

ii. මෙතුමා විධායක ජනාධිපති ධුරයට පත්වූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ද? ______________________________

28. i. C රූපය හඳුනාගෙන නම් කරන්න.

______________________________

ii. මෙතුමා සංගායනාවේදී දැරූ කාර්ය භාරය කුමක් ද?

______________________________

29. i. D රූපය හඳුනාගෙන නම් කරන්න.

______________________________

ii. ඇය ලොව කීවෙනි අගමැතිනිය ද?

______________________________

30. i. E රූපය හඳුනාගෙන නම් කරන්න.

______________________________

ii. ලෝක දේශපාලනයේ තරමාදර්ශී කාන්තාව ලෙස හැඳින්වෙන මෑත ලොව කුමන රටේ අගමැතිනිය ද? ______________________________

(ලකුණු 2 x 5 = 10)

- **ප්‍රශ්න අංක 31 - 35 දක්වා ප්‍රශ්න වලට "අ" තීරුව හා "ආ" තීරුව යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

31. කාර්මික විප්ලවයේ නව සොයා ගැනීම් සිදු කළ පුද්ගලයන් "අ" තීරුවේ ද ඔවුන් සොයාගත් දේ "ආ" තීරුවේ ද දැක්වේ. "අ" සහ "ආ" ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| I. ඩේම්ලර් | A. වාෂ්ප එන්ජිම |
| II. ගැලීලියෝ ගැලිලි | B. රූපවාහිනිය |
| III. ජේම්ස් වොට් | C. මෝටර් රථය |
| IV. ජෝන් මැකඩම් | D. මැකඩම් ක්‍රමය |
| V. ජෝන් ලොගී බෙයාඩ් | E. දුරදක්නය |

1. D A B C E
2. C E A D B
3. C D A B E
4. A C E D B
5. D C A B C

32. "අ" තීරුවේ දැක්වෙන යන්ත්‍රය හා සම්බන්ධ ක්ෂේත්‍රය "ආ" තීරුවෙන් ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| I. ATM | A. කෘෂිකර්මය |
| II. ECG | B. ආරක්ෂාව |
| III. RFID | C. සෞඛ්‍ය |
| IV. CCTV | D. අධ්‍යාපනය |
| V. MULTIMEDIA PROJECTOR | E. බැංකු කටයුතු |

1. A C B D E 2. A B D C E 3. B C A E D 4. D A B E C 5. E C A B D

33. "අ" තීරුවේ වැඩිවීම "ආ" තීරුවේ වැඩිවීමට බලපෑම් ඇතිකරන ආකාරය ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| I. පොසිල ඉන්ධන භාවිතය | A. ඵලදායීතාවය |
| II. යැපෙන්නන් | B. ක්‍රය ශක්තිය |
| III. කාර්යක්ෂමතාවය | C. සේවා නියුක්තිය |
| IV. ආදායම | D. කුටුම්භ වියදම |
| V. තාක්ෂණික දියුණුව | E. ගෝලීය උණුසුම |

1. E D A B C 2. A C B D E 3. B C A E D 4. C D B A E 5. E A B C D

34. "අ" තීරුවේ වැඩිවීම "ආ" තීරුවේ අඩුවීමට බලපෑම් ඇති කරන ආකාරය ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| I. සාක්ෂරතාවය | A. වන ගහනය |
| II. විකල්ප බලශක්ති භාවිතය | B. දරිද්‍රතාවය |
| III. සංවර්ධනය | C. නුගත්කම |
| IV. සේවා නියුක්තිය | D. පරිසර දූෂණය |
| V. නිෂ්පාදනය | E. මිල |

1. A D B C E 2. A B C E D 3. B E C D A
4. C D A B E 5. C A B E D

35. "අ" තීරුවේ දැක්වෙන රජවරුන්ගේ බිසෝවරු "ආ" තීරුවේ දැක්වේ. එය නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| I. මහා විජයබාහු රජු | A. ලීලාවතී බිසව |
| II. මහා පරාක්‍රමබාහු රජු | B. තිලෝකසුන්දරී බිසව |
| III. නිශ්ශංකමල්ල රජු | C. ශ්‍රී රංගම්මා බිසව |
| IV. I විමලධර්මසූරිය රජු | D. කුසුමාසන දේවිය |
| V. ශ්‍රී වික්‍රමරාජසිංහ රජු | E. කල්‍යාණවතී බිසව |

1. B D E C A 2. B E D C A 3. B A D E C 4. B D C E A 5. B A E D C

(ලකුණු 2 x 5 = 10)

• ප්‍රශ්න අංක 36 - 40 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.

36. I. ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා නම් කරන්න.

...................................................................... (ලකුණු 01)

II. ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණ ආයතන දෙක නම් කරන්න.

1. ..............................................

2. .. .......................................... (ලකුණු 02)

III. නීතියේ ආධිපත්‍ය තහවුරු වී තිබෙන සමාජයක දැකිය හැකි ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න.

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 02)

37. I. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට හේතුවන ප්‍රධාන වායු වර්ගය නම් කරන්න.

...................................................................... (ලකුණු 01)

II. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට බලපාන.

* මානුෂ සාධකයක් ..........................................................................

* ස්වභාවික සාධකයක් ...................................................................... (ලකුණු 02)

III. දේශගුණික වෙනස්වීම් මානව කටයුතු වලට ඇති කරන අහිතකර බලපෑමක් කෙටියෙන් විස්තර කරන්න. ..............................................................................

.......................................................................................................... (ලකුණු 02)

38. I. සතුරු බලය පරදා ප්‍රථම වරට ලක්දිව එක්සේසත් කළ රජතුමා කවුද?

...................................................................... (ලකුණු 01)

II. එතුමාගෙන් සිදු වූ

* ආර්ථික සේවාවක් ..........................................................................

* ආගමික සේවාවක් ........... ............................................................

(ලකුණු 02)

III. කෝට්ටේ යුගයේ සාහිත්‍ය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 02)

39. I. ශ්‍රී ලංකාවේ බහුලව භාවිතා වන බලශක්ති වර්ගය කුමක් ද?

...................................................................... (ලකුණු 01)

II. පුනර්ජනනීය බලශක්ති වර්ග දෙකක් ලියන්න.

1. ...................................... 2. ........................................ (ලකුණු 02)

III. ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති භාවිතය ඉහළ නැංවීමේ දී මුහුණපාන අභියෝගයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

.......................................................................... ...............................

..........................................................................................................

(ලකුණු 02)

40. I. GPS තාක්ෂණයට චන්ද්‍රිකා තොරතුරු ලබා ගැනීම හා මෙහෙයවීම සඳහා ඇති ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය පිහිටි රට කුමක් ද? ..............................................

(ලකුණු 01)

II. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අහිසි ලෙස භාවිතයේ දී නූතන සමාජය මුහුණපාන ගැටළු දෙකක් ලියන්න.

1. ..............................................................................................

2. ..............................................................................................

(ලකුණු 02)

III. සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයෙන් ඇතිවන අපරාධ අවම කර ගැනීමට ඔබ කරන යෝජනාවක් කෙටියෙන් විස්තර කරන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

(ලකුණු 02)

- **ප්‍රශ්න අංක 41 - 45 දක්වා ඇති වගන්ති ඇසුරෙන් ස්ථාන හඳුනාගෙන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.**


41. ශ්‍රී ලංකාවේ මුල්ම රාජධානිය පිහිටි නගරය.
42. වැව් බැම්ම සැතපුම් හතක් (7) දිගට චාපාකාර හැඩයකින් නිර්මාණය කර ඇති වැව.
43. ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන සංඝමිත්තා තෙරණිය ශ්‍රී ලංකාවට ගොඩ බට වරාය.
44. ලෝක උරුමයක් ලෙස සැලකෙන මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි ශේෂ කන්ද.
45. කතරගම ප්‍රදේශය හරහා ගලා බසින ගංඟාව.


(ලකුණු 1 x 5 = 05)

**ප්‍රශ්න අංක 46 - 50 දක්වා ඇති වගන්ති ඇසුරෙන් ස්ථාන හඳුනාගෙන සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.**

46. නයිල් ගංගාව ආරම්භ වන විල.
47. 1453 දී කුරුස යුද්ධයෙන් පසු ඔටෝමන් තුර්කීන් විසින් අයත් කර ගත් ප්‍රධාන වෙළඳ නගරය.
48. පැසිෆික් සාගරය හා අත්ලාන්තික් සාගරය යා කරන ඇළ.
49. වර්තමානයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ බහුලව භාවිතා කරන රට.
50. 2018 වර්ෂයේ උතුරු කොරියානු ජනාධිපති සහ ඇමෙරිකානු ජනාධිපති අතර ප්‍රථම ඓතිහාසික හමුවීම සිදු වූ රට.

(ලකුණු 1 x 5 = 05)






LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න